**<u>ජා-ඇල නගර සභාව</u>**

**<u>ගම්පහ දිස්ත්‍රික්කය</u>**

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, **එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 25 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජා-ඇල නගර සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පැසිපන්දු ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා 2017 ජනවාරි 26 දින ලැබූ රු.500,000 ක්, ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම් ගතකර තිබූ හෙයින් එම වටිනාකමින් ණයගැතියෝ වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2018 වර්ෂයේ ගෙවා තිබූ රු. 38,975 ක් වූ විවිධ ණයහිමියන්, 2017 දෙසැම්බර් 31 දිනට උපචිත කොට පෙන්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2018 ජනවාරි මාසයේ ගෙවා තිබූ රු.334,500 ක් වූ ගබඩා ණයහිමියන් 2017 දෙසැම්බර් 31 දිනට ගිණුම් ගත කොට නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ මිලදී ගත් මුළු වටිනාකම රු.8,360,081 ක් වූ විදුලි හා පොදු ගබඩා භාණ්ඩ, ගබඩා ණයහිමි ගිණුමට සටහන් කර තිබීම නිවැරදි කිරීම සඳහා පොදු ගබඩා ගිණුමට පමණක් සටහන් කර තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ ගබඩා ණයහිමි ගිණුම මගින් නිකුත් කර තිබූ මුළු වටිනාකම රු.7,716,980 ක් වූ විදුලි හා පොදු ගබඩා භාණ්ඩ නිවැරදි කිරීම පොදු ගබඩා ගිණුමට පමණක් සටහන් කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ වාහන අපහරණ වෙන්දේසියේදී, ට්‍රේලරයක් අලෙවිකර තිබුණද, එහි පිරිවැය රු.285,000 ක් මෝටර් රථ හා කරත්ත ගිණුමෙන් ඉවත් කර නොතිබුණි.

(උ) ව්‍යාපෘති 04 ක් සඳහා 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර මුදල රු.4,100,417 ක් වුවද රු.3,690,300 ක් පමණක් ගිණුම් ගත කර තිබූ බැවින් එම ගිණුම රු.410,118 ක් අඩුවෙන් ගිණුම් ගත කොට තිබුණි.

(ඍ) හිමිකම් නොපෑ ණයහිමියන් රු.13,740,346 ක වටිනාකම තුල ඉල්ලීමක් නොකරන බවට තහවුරු කරගෙන නොතිබූ රු.5,341,849 ක් සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කල ගිණුම හා ලේඛන/උපලේඛන අතර විෂයයන් 04 ක වෙනස්කම්වල එකතුව රු.1,921,189 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) රු.241,295 ක අගරු චෙක්පත් වටිනාකමක් නැවත අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට, කලින් ලද ආදයම් ගිණුමෙහි වු රු.200,479 ක බැර ශේෂය හඳුනා ගෙන නිරවුල් කර නොතිබුණි

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

ලේඛන,උපලේඛන හා විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.37,645,626 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) නගර සහා ආඥා පනතේ (255 අධිකාරය) 84 (1) | අනවසර ඉඩම් හා ගොඩනැගිලි ඉවත් කිරීමට කටයුතු කල යුතු වුවද කොළඹ ජා-ඇල අධිවේගී පිවිසුම් මාර්ගයට අයත් ඉඩම් කොටස් 08 ක් ඉවත්කර වීම හෝ නතරකර වීම කර නොතිබුණි. |
| (ආ) 2017 අගෝස්තු 30 දිනැති අංක LGD/06/02/04/පොදු දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය | කඩ හිමියන්ගෙන් පෙර මුදල් ලබාගෙන සාදා ඇති ගොඩනැගිලිවල කඩ කාමර අයිතිය පැවරීම හා අතුරු බදුකරුවන් සඳහා පැවරීමට නව තක්සේරුවක් මත ගණනය වන මාසික බදු කුලිය මෙන් 60 ගුණයකට නොඅඩු වටිනාකමක් අයකර ගැනීමෙන් පසු 2018 මාර්තු 31 ට පෙර පවරා දීමේ හැකියාවක් පැවතුණද වසර 05 කට වරක් සිදුකල යුතු තක්සේරුව සිදු නොවීම නිසා 2018 |

මාර්තු 31 ට පෙර අතුරු බදුකරුවන්ට පවරා දීමට නොහැකිව තිබූ බැවින් සභාවට විශාල ආදායමයක් අහිමිවී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.29,109,990 ක් වූ අතර ,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 21,407,740 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` |
| (i) | වරිපනම් හා බදු | 36,675 | 41,804 | 26,630 | 21,011 | 36,708 | 41,128 | 23,073 | 20,810 |
| (ii) | කුලී | 8,560 | 8,875 | 8,835 | - | 7,860 | 7,723 | 6,748 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 462 | 1,330 | 1,330 | - | 482 | 462 | 462 | - |
| (iv) | වෙනත් ආදායම් | 64,369 | 28,626 | 28,626 | 172 | 41,023 | 17,137 | 17,137 | 4,396 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර ගාස්තු අයකිරීම්, ඇස්තමේන්තුව ඉක්මවා සියයට 187.9 ක වැඩිවීමක් වූ හෙයින් ඇස්තමේන්තු කිරීම තාත්වික ආකාරයෙන් සිදු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තු කර තිබූ වෙනත් ආදායමින් සියයට 44.5 ක් පමණක් එකතුකර තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

-----------------

නිවාස කඩා ඉවත් කිරීම මත සමාලෝචිත වර්ෂයේදී රු.1,464,475 ක වරිපනම් බදු වටිනාකමක් කපා හැර තිබුණද, වරිපනම් ඒකක කඩා ඉවත් කළ බවට අදාල ග්‍රාම නිලධාරීන්ගෙන් තහවුරුවක් ලබා ගෙන නොතිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

----------------

නාගරික බල ප්‍රදේශයේ පිහිටි සංචාරක සංවර්ධන පනත යටතේ ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි අවන්හල් හා තානායම්වලින් අයකර තිබූ රු.394,839 ක බලපත්‍ර ගාස්තු සඳහා පසුගිය වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගත් මුළු පිරිවැටුමෙන් සියයට 1 ක නොඉක්මවන ගාස්තුවක් හඳුනා ගෙන අයකර ගෙන නොතිබුණි.

2.2.5 කුලී

------

විවිධ හේතූන් මත සභාවට ආපසු පවරාගෙන තිබූ පොදු වෙළඳපල කඩකාමර 05 ක් බදුදීමට කටයුතු කර නොතිබුණි.

2.2.6 වෙනත් ආදායම්

------------------

(අ) කසළ බැහැර කිරීමේ ගාස්තු

-----------------------------------

රීති පැනවීමකින් තොරව පුද්ගලික ආයතනවලින් කසළ බැහැර කිරීම් ගාස්තු අයකර තිබුණි.

(ආ) මුද්දර ගාස්තු

---------------

2014 අගෝස්තු මාසයේ සිට 2017 දෙසැම්බර් මාසය දක්වා කාල සීමාවට අදාල මුද්දර ගාස්තු ආදායම්, අයකර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්ය සාධනය

----------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

-------------------------------------

(i) පැසිපන්දු ක්‍රීඩාංගණයට කණු සපයා සවි කිරීම සඳහා රු.1,050,000 ක මුදලකට මාස 03 කින් නිම කිරීමට 2016 දෙසැම්බර් 14 දින ගිවිසුම් ගතවී තිබුණමුත් 2018 මැයි 31 දින වන විටත් නිම කර නොතිබුණි.

(i i) පැසිපන්දු ක්‍රීඩාංගණයට පෙරමුසු ඇතිරීම සඳහා රු.1,130,435 ක මුදලකට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුම් ගතවී තිබුණද නිම කළ යුතු දිනය ගිවිසුමේ දක්වා නොතිබුණි. 2018 මැයි 31 දින වන විටත් එම කාර්යය නිම කර නොතිබූ අතර බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් රු.1,000,000 ක මුදලක්ද මේ සඳහා ලැබී තිබුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

කොම්පෝස්ට්කරණයට හා ප්‍රතිචක්‍රීකරණයට ලක් කළ නොහැකි කසළ සුදුවැල්ල කසළ අංගනයට බැහැර කිරීමේදී පස් යොදා නොතිබීම නිසා අධික දුර්ගන්ධයක් පැවතීම හා මැසි මදුරු ගහණය වැඩිවීමෙන් පරිසරයට අහිතකර ලෙස බලපෑමක් සිදුව තිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් දැනුවත්වීමක් සිදුව නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

(අ) අක්කර 11 රූඩ් 01 පර්චස් 19.2 ක් වූ නුගගහ කුඹුර ඉඩම මැනීම් කර සභාව සතු දේපලක් ලෙස වෙන්කර ගෙන නොතිබුණි. මෙම ඉඩමේ අනවසර නිවාස ඇති බව අනාවරණයවී තිබූ නමුත් එම අනවසර නිවාස ඉවත් කිරීම සම්බන්ධයෙන් විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 2008 නොවැම්බර් 20 දිනැති අංක ඩබ්ලිව්/එල්පීඩී/15/2008 දරන චක්‍රලේඛය ප්‍රකාරව අනවසර ඉදිකිරීම් පාලනය සම්බන්ධයෙන් පියවර ගත යුතු අතර දිස්ත්‍රික් ලේකම්ගේ 2016 ජූනි 09 දිනැති අංක ගම්/දික්‍ර.ලේ/03/ජනාධිපති රැස්වීම/2016 දරන ලිපිය ප්‍රකාරව බස්නාහිර පළාත තුළ සියලු කුඹුරු ඉඩම් හා පහත් බිම් ගොඩ කිරීම තහනම් කර ඒ සඳහා අවසර ලබා නොදීමට පියවර ගන්නා ලෙස දැනුම්දී තිබුණද පහත සඳහන් බැහැරවීම් සිදුව තිබුණි.

(i) අධිවේගී පිවිසුමේ ආරම්භයේ දකුණු පස පිහිටි කුඹුරු ඉඩම පස් පුරවා ඇල මාර්ගය හරස් කර සම්පූර්ණයෙන් කොන්ක්‍රීට් කර තිබූ අතර, එය ජා-ඇල කොළඹ අධිවේගී මාර්ගයේ පිවිසුමට සෘජුවම සම්බන්ධ කර තිබීම.

(ii) ජා-ඇල කලඑළිය සෝවිස් මාවත තොටුපල පාර මහ ඇලට සම්බන්ධ වන ඇල මාර්ගය හරස්කර කුඹුරු ඉඩමක් පස් පුරවා වාහන අලුත්වැඩියා කරන ආයතනයක ගොඩනැගිල්ලක් ඉදි කර එය වටා තාප්පයක් ඉදිකිරීම නිසා ජලය බැස යාමට ප්‍රමාණවත් නොවන පරිදි ඇල මාර්ගය පටුවී තිබුණි. මෙය අනවසර ඉදි කිරීමක් බව පිළිගෙන තිබියදී ඒ සම්බන්ධයෙන් කටයුතු නොකර, මෙම ව්‍යාපාරික ස්ථානය සඳහා ව්‍යාපාර බලපත්‍රයක් නගර සභාව විසින් නිකුත් කර තිබීම.

(iii) රිලවුල්ල හන්දියෙන් වමට ඇති මාර්ගය අසල මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වූ අයදුම්පත්‍රයේ අදාල කිසිදු කොටසක් සම්පූර්ණ නොකර තිබියදී අනුකූලතා සහතිකය නිකුත් කිරීම සඳහා සභා ලේකම් විසින් නිර්දේශ කර අනුමත කර තිබුණද අනුමත සියලු කරුණු උල්ලංඝනය කරමින් සම්පූර්ණ භූමියම ඉදිකිරීම සඳහා යොදා ගෙන තිබීම.

## 3.3 වත්කම් කළමනාකරණය

----------------------------

නිරවුල් කර නොගත් සභා දේපල

--------------------------------------

සභාවට අයත් නිශ්චල දේපල 17 ක් සඳහා ඔප්පු / පැවරුම් ඔප්පු සභාව සතු නොවූ අතර එම දේපලවල අයිතිය නිරවුල් කර ගැනීමට හා ප්‍රමාණය හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද පළාත් පාලන ආයතන භුක්ති විඳින රජයේ ඉඩම් සඳහා පැවරුම් නියෝග සම්බන්ධයෙන් බස්නාහිර පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කර තිබූ 2010 සැප්තැම්බර් 20 දිනැති අංක LGD/06/B/02/පොදු දරන ලිපිය කෙරෙහිද අවධානය යොමු කර නොතිබුණි.

## 3.4 ප්‍රසම්පාදනය

--------------

### 3.4.1 සැපයීම් හා සේවා

-------------------

2017 අප්‍රේල් 04 සිට 2018 අප්‍රේල් 04 දක්වා සභාවට ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා ගිවිසුම්ගතව තෝරාගත් ආරක්ෂක සමාගම දින 03 කට පසු ආරක්ෂක සේවය සැපයීමට නොහැකිබව දන්වා තිබූ නමුත් ගිවිසුම් ප්‍රකාරව ලබාගත යුතු රු. 250,000 ක් වටිනා බැංකු ඇපකරය ලබා නොගැනීම නිසා සභාවට සිදු වූ පාඩුව අයකර ගැනීමට නොහැකිවී තිබුණි. පසුව තෝරාගත් පුද්ගලික සමාගම ආරක්ෂාව සැපයීමේදී ගිවිසුමේ 17 (අ) ප්‍රකාරව ඒ ඒ ස්ථාන සඳහා ආරක්ෂක නිලධාරීන් නිසි පරිදි සේවයේ යොදවා නොමැති බව අනාවරණය විය.

### 3.4.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

(අ) කපාල කන්ද පාර (රෝහල් පාර) අඩි 120 ක් ගල්අතුරා තාර දැමීම රු.247,794 ක් වැය කර ඉටු කර තිබූ අතර මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු සැකසීම, ප්‍රතිපාදන අනුමත වීම, මිළ ගණන් කැඳවීම, ගිවිසුම අත්සන් කිරීම, කර්මාන්තය ඉටුකිරීම හා ගෙවීම කිරීම් ආදී සියලු කරුණු කපාල කන්ද පාර (රෝහල් පාර) යන නමින් ඉටුකර තිබුණි. එහෙත් 2017 නොවැම්බර් 22 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී සංවර්ධනය කරන ලද මෙම මාර්ග කොටස පෙන්වීමට සභාවේ තාක්ෂණ නිලධාරි අපොහොසත් වූ අතර, ඒ වෙනුවට සංවර්ධනය කළ වෙනත් මාර්ගයක් පෙන්වන ලදී.

(ආ) වැවල ශාන්ත රීටා පාරේ අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.391,991 ක මුදලකට මාස 01 කින් නිම කිරීමට 2011 නොවැම්බර් 09 දින ගිවිසුම් ගතවී 2011 දෙසැම්බර් 23 දින රු.305,615 ක් ගෙවීම් කර තිබූ අතර මෙම කොන්ක්‍රීට් කිරීම ගිවිසුම් ගතවීමට පෙර කර තිබුණි. තවද කොන්ක්‍රීට් කිරීමට විරුද්ධව මෙම මාර්ගයට සම්බන්ධ පිඹුරේ අංක 07 දරන කොටසේ හිමිකාරිය ඇයගේ ඉඩමෙන් කොටසක් නගර සභාව විසින් අයිතිකරගෙන ඇති බව පවසා 2011 ඔක්තෝබර් 04 දින මීගමුව දිසා අධිකරණයේ පැමිණිල්ලක් ගොනු කර තිබුණි. හිමිකාරිය මාර්ගය හරස්කර කණු සිටුවීමක් සිදුකර තිබීම නිසා නගර සභාව විසින්ද නඩු දෙකක් ගොනුකර නීතිඥ ගාස්තු වශයෙන් 2017 වර්ෂයේදී රු.35,000 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන්ද කෙරේ.

(i) ගම්පහ දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ 2016 අප්‍රේල් 18 දිනැති ලිපියකට අනුව මෙම මාර්ගය නගර සභාව සතු මාර්ගයක් නොවන බව තහවුරුවී තිබුණි.

(ii) 2017 සැප්තැම්බර් 18 දිනැති තීරණය පරිදි පිඹුරේ අංක 07 දරන කොටසේ පාරට මායිම්වී ඇති කොන්ක්‍රීට් කොටස කපා ඉවත් කිරීමට තීරණය කර තිබීම නිසා සභාවට සැලකිය යුතු පාඩුවක් සිදුව තිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර ලේකම්වරයාගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| | ------------- | ------------- |
| (අ) | ආදායම් කළමනාකරණය | ග්‍රාම නිලධාරි තහවුරුවක් නොමැතිව වරිපනම් කපාහැරීම් සිදු කිරීම. |
| (ආ) | ගිණුම්කරණය | ගිණුම් ශේෂවල වෙනස්කම් පැවතීම. |
| (ඇ) | අනවසර ඉදිකිරීම් | අනවසර ඉදි කිරීම් නියමානුකූල කිරීම. |
| (ඈ) | වත්කම් පාලනය | සභාව සතු වත්කම් හඳුනාගැනීමට කටයුතු නොකිරීම. |